softlogic INVEST

# FAQs

## සේවාලාභී ලියාපදිංචිය

**පැ: මම අලුත් ආයෝජකයෙක්. ඉන්වෙස්ට් එකට මට ලියාපදිංචි වෙන්න කොහොමද?**
කරුණාකර www.softlogicinvest.lk එකට ගිහින්, “register” - කියන එක ක්ලික් කරලා හොඳ සැලකිල්ලෙන් තොරතුරු ඇතුලත් කරලා ලියාපදිංචි වෙන්න.

**පැ: සොෆ්ට්ලොජික් invest ගැන වැඩි විස්තර ලබා ගන්නේ කොහොමද?**
1. කරුණාකර අපගේ වෙබ් අඩවිය වන www.softlogicinvest.lk වෙත පිවිසෙන්න
2. අපගේ දුරකථන අංකය වන 011 2104304 අමතන්න
3. info@softlogicinvest.lk වෙත විද්‍යුත් තැපැල් (email) පණිවිඩයක් යවන්න
4. අපගේ අරමුදල් කළමනාකරු 077 3284762 අමතන්න

**පැ: මට තාම OTP එක ලැබුනේ නෑ. මොකක්ද ඒකට කරන්නේ?**
ඔබේ ජාතික හැඳුනුම්පත සඳහා නිකුත් කරන ලද දුරකථන අංකයට OTP එක එවනවා. කරුණාකර අංකය පරීක්ෂා කර නැවත උත්සාහ කරන්න. එසේම, ටෙලිකොම් සේවා සැපයුම් අංශයේ යම් ප්‍රමාදයක් සිදුවෙන්නත් පුලුවන්. කරුණාකර මිනිත්තු කිහිපයකින් නැවත උත්සාහ කරන්න. රැඳී සිටියාට ස්තුතියි.

**පැ: ලියාපදිංචි වන අවස්ථාවේදී මම මගේ පෞද්ගලික තොරතුරු ඇතුළත් කළ යුත්තේ ඇයි?**
ඔබ ආයෝජකයෙකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා ඔබේ නම, ලිපිනය, දුරකතන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය ඉතා වැදගත් වෙනවා. ගිණුම් විවෘත කිරීමේ ෆෝම් එක ඔබ වෙත යොමු කිරීම සඳහා මෙම තොරතුරු අපට අත්‍යවශ්‍යයි.

**පැ: ආයෝජන මුදල ඇතුළත් කිරීමෙන් පසු මට කර්සරය ක්‍රියාගැන්විය නොහැක.**
එක් එක් අරමුදල සඳහා අවම ආයෝජනය රු.5,000 යි. ඒ නිසා අවම ආයෝජන මුදල වන රු.5,000 ට වඩා අඩු අගයක් ඇතුළත් කිරීමට යාමේදී කර්සරය ක්‍රියාත්මක වෙන්නේ නෑ.

**පැ: මගේ මුදල් තැන්පත් කරන්නේ/ ආයෝජනය කරන්නේ කොහොමද?**
පහත සඳහන් විදිහට.
- ලඟම තියෙන බැංකුවට ගිහින් HNB එකතු කිරීමේ ගිණුමකට මුදල් තැන්පත්
- Online බැංකු හුවමාරුවක්
- සම්පූර්ණයෙන් පුරවපු ගිණුම් ආරම්භ කිරීමේ ෆෝම් එකක් එක්ක චෙක්පතක් තැපැල් මූලික ලියාපදිංචි කිරීමේ පියවරයන් සම්පූර්ණ කලාම, ඔබට reference number එකක් එක්ක sms පණිවිඩයක් ලැබෙයි.

බැංකු තැන්පතු ෆෝම් එකේ මෙම යොමු අංකය (reference number) එක ලියන්න. Online මඟින් සිදු කරන්නේ නම් “transfer reference field” එක සඳහන් කරන්න.

එකතු කිරීමේ ගිණුම් (Collection Account) විස්තර:

| | |
|---|---|
| ගිණුමේ නම: | සොෆ්ට්ලොජික් ඇසෙට් මැනේජ්මන්ට් (පුද්) සමාගම |
| ගිණුම් අංකය: | 003010534505 |
| බැංකුවේ නම: | හැටන් නැෂනල් බැංකුව (බැංකු අංකය: 7083) |
| ශාඛාවේ නම: | ප්‍රධාන කාර්යාලය (ශාඛා අංකය: 003) |
| SWIFT කෝඩ් එක: | HBLILK LXXXX |

softlogic INVEST

**පැ: මට කෙළින්ම සල්ලි වලින් ආයෝජනය කරන්න පුලුවන්ද?**

කිසිදු තත්වයක් යටතේ අපි මුදල් භාර ගන්නේ නෑ. බැංකු තැන්පතුවකින් හරි බැංකු online හුවමාරුවක් මඟින් හරි චෙක්පතක් මාර්ගයෙන් ඔබට ඔබේ ආයෝජනය සිදු කරන්න පුලුවන්.

**පැ: මම online ලියාපදිංචිය සම්පූර්ණකරත් සොෆ්ට්ලොජික් ඉන්වෙස්ට් එකෙන් තවම කෝල් එකක් ආවේ නැනේ**

ඔබගේ ලියාපදිංචියෙන් පස්සෙ වැඩ කරන දවස් දෙකක් ඇතුළත අපගේ නියෝජිතයෙකු ඔබ හා සම්බන්ධ වෙනවා. ස්තූතියි හැකි ඉක්මනින් ඔබත් එක්ක ගනුදෙනු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

**පැ: මට සොෆ්ට්ලොජික් ඉන්වෙස්ට් එකෙන් ලියාපදිංචියටයි verification වලටයි කෝල් එකක් ආවට තාම මට ඇප්ලිකේෂන් ෆෝම් (Application form) එක ආවේ නෑ. මම මොකක්ද දැන් කරන්නේ?**

info@softlogicinvest.lk එකට ඊමේල් (email) පණිවිඩයක් එවන්න.

**පැ: මට ලියාපදිංචි වෙන්න උදව් ඕනේ. මම ඒක කරන්නේ කොහොමද?**

කරුණාකර අපගේ හදිසි ඇමතුම් අංකය 0112 104 304 ට කතා කරන්න, ඔබට උදව් කරන්න අපි ලෑස්තියි.

**පැ: මගේ ලියාපදිංචි කිරීම  සම්පූර්ණ කරන්න ඕනේ ලියකියවිලි මොනවාද?**

- පුරවා අත්සන් කල ඔබේ ගිණුම් විවෘත කිරීමේ ෆෝම් (Application form) එක
- පුරවා අත්සන් කරන ලද KYC ෆෝම් එක
- ඔබේ ජාතික හැඳුනුම්පතේ පිටපත (දෙපසම)

  ලිපිනය සනාථ කිරීමේ ලියවිල්ලක්

  ලිපිනය සනාථ කිරීම අවශ්‍ය වෙන්නෙ ෆෝම් එකේ දක්වා ඇති ඇති ලිපිනය ඔබේ ජාතික හැඳුනුම්පතේ ලිපිනයට වඩා වෙනස් නම් පමණි. මෙයින් අප අදහස් කරන්නේ පසුගිය මාස 3 තුළ ඔබට ලැබුණු ජල බිල්පතක් හෝ විදුලි බිල්පතක් . එකකෙන් ඔබේ පදිංචිය සනාථ කරගන්න පුළුවන්.

**පි: මම මගේ ගිණුම් ආරම්භ කිරීම සහ KYC ෆෝම් එක සම්පූර්ණ කලා. සොෆ්ට්ලොජික් ඉන්වෙස්ට් එකට ඒවා එවන්නේ කොහොමද?**

සියලුම ලියකියවිලි පහත සඳහන් ඕනෑම ක්‍රමයකට යවන්න ඔබට පුලුවන්

- තැපැල් - සොෆ්ට්ලොජික් ඉන්වෙස්ට්, 16 වන මහල, වන් ගෝල් ෆෙස් පරිශ්‍රය, කොළඹ 02, ශ්‍රී ලංකාව
- Viber / Whatsap - 0764784171
- ස්කෑන් /PDF ලේඛන -  info@softlogicinvest'lk

**පැ: බාල වයස්කරුවෙකුට ගිණුමක් ආරම්භ කරන්නේ කොහොමද?**

ගිණුම් විවෘත කිරීමේ ෆෝම් (Application form) එක පුරවද්දි භාරකරුට ඔහුගේ  හෝ ඇයගේ විස්තර "ගිණුම් හිමියා (Account holder)" කියන කොටසේ පුරවලා බාල වයස්කරුගේ තොරතුරු "ඒකාබද්ධ ඒකක විශ්වාස ගිණුම "Joint unit trust account"  කොටසේ පුරවන්න ඕනේ. ඊට පස්සෙ ඉතිරි කොටස් ටික සාමාන්‍ය විදිහට ඔබට පහසු ආකාරයකට අපට එවන්න. ගිණුම් විවෘත කිරීමේ ෆෝම් එක ඩවුන්ලෝඩ් කරගන්න මෙතන ක්ලික් කරන්න.

softlogic INVEST

## දැනටමත් ලියාපදිංචි වුණු සේවාදායකයින් සඳහා

පැ: මගේ ආයෝජනය track කරන්නේ කොහොමද?
www.softlogicinvest.lk වෙබ් අඩවියට ගිහින් ඔබේ ජාතික හැඳුනුම්පත එක්ක ඔබේ Profile එකට පිවිසෙන්න.

පැ: මගේ මුදල් සොෆ්ට්ලොජික් ඉන්වෙස්ට් එකට ලැබුණාද දැන ගන්නේ කොහොමද?
ඔබට sms පණිවුඩයකින් ගෙවීම් තහවුරු කිරීමක් ලැබෙයි.

පැ: ආරම්භක ආයෝජනයෙන් පස්සෙ ආපහු ඉන්වෙස්ට් කරන්නේ කොහොමද?
ඔබේ profile එකට ලොග් (log) වෙලා අරමුදල් මිලදී ගන්න ඉල්ලුම් කරන්න. “Purchase form” එක පුරවන්න (ඩවුන්ලෝඩ් කරන්න මෙතන ක්ලික් කරන්න) දැන් සුපුරුදු විදිහට ඒක අපට එවන්න.

පැ: මට Equity සහ Money market කියන දෙකේම ඉන්වෙස්ට් කරන්න පුලුවන්ද?
ඔව්, එක් එක් අරමුදල සඳහා අවම වශයෙන් රු: 5,000ක් යොදන්න ඔබට පුලුවන්.

පැ: මට එක් අරමුදලකින් තවත් අරමුදලකට මුදල් මාරු කරන්න පුලුවන්ද?
ඔව්, ඔබට අරමුදල් අතර මාරු වෙන්න පුලුවන්. ඔබගේ profile එකට ගිහින් “switch form” එකක් පුරවන්න (ඩවුන්ලෝඩ් කරන්න මෙතන ක්ලික් කරන්න. දැන් සුපුරුදු විදිහට ඒක අපට එවන්න).

පැ: Unit එකක ගාණ හැදෙන්නේ මිල කීයකටද?
හවස 6.00 දක්වා ලැබෙන request වලට වර්තමාන ප්‍රකාශිත මිල ලැබෙනවා.
දවසේ දවල් 12ට පෙර ලැබෙන request වලට එදිනට නියමිත මිල ලැබෙනවා. දහවල් 12 න් පස්සෙ එන හැම request එකකටම ඊළඟ දිනට නියමිත මිල ලැබෙනවා.
(to be confirmed)

## ආපසු මුදල් ලබා ගැනීම

පැ: මගේ මුදල් ආපහු ගන්නේ කොහොමද?
ඔබේ profile එකට ලොග් වෙලා redemption request එකක් කරන්න. නැතිනම් “Redemption form” එකක් පුරවන්න (ඩවුන්ලෝඩ් කරන්න මෙතන ක්ලික් කරන්න. දැන් සුපුරුදු විදිහට ඒක අපට එවන්න).

පැ: මට සේරම මුදල් නැතුව, ඒකෙන් කොටසක් පමණක් ලබා ගන්න පුලුවන්ද?
ඔව් ඔබට පුලුවන්.

පැ: මම විකුණන්න තීරණය කරොත් මගේ මුදල් කොච්චර ඉක්මනින් මට ලබා ගන්න පුලුවන්ද?
වලංගු Redemption order එකක් ලබා දුන්නට පස්සෙ වැඩ කරන දින තුනක් ඇතුළත ඔබට පුලුවන්.

softlogic INVEST

# සාමාන්‍ය විමසීම්

## පැ: අරමුදලක් (fund) කියන්නෙ මොකක්ද?

අරමුදලක් (Fund ekak) කියන්නේ පොදු ආයෝජන අරමුණක් තියෙන තවත් බොහෝ ආයෝජකයින් දායක වුණ සාමූහික ආයෝජන සංචිතයක්. මූල්‍ය සුරැකුම්පත් මිලදී ගන්න මේ මුදල් සංචිතය භාවිතා කරනවා. ආයෝජනය කරපු මුදල් වෙනුවට,අර කියපු අරමුදල විසින් එක් එක් ආයෝජකයාට අරමුදල් ඒකක (units) නිකුත් කරනවා, එතකොට ඔබත් ඒ ඒකක දරන්නෙක් (unit holder) විදිහට පත්වෙනවා.

භාරකාර ඔප්පුවක් මගින් පිහිටුවන ඒ අරමුදල ස්වාධීන නීතිමය ආයතනයක් බවට පත් වෙනවා. එකට තමන්ගේම මූල්‍ය ගිණුම් තියෙනවා වගෙම බදු වාර්තාත් ගොනු කරනවා. මේ මුදල් භාරය පරිපාලනය කරන්නේ එහි භාරකරු වෙන හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින්.

## පැ: විවෘත අරමුදලක් (open fund) කියන්නේ මොකක්ද?

විවෘත අරමුදලක් කියන්නේ ආයෝජකයින්ට ඕනෑම වේලාවක මුදල් යොදවලා ආපහු ගන්න පුලුවන් අරමුදලකට. අරමුදල විසින් නිකුත් කරපු ඒකක ගණනට කිසිදු සීමාවක් නෑ වගේම ඒ අරමුදලට කල්පිරීමකුත් නෑ..

## පැ: ඒකක භාර අරමුදල් සඳහා ආයෝජනය කරන්නේ ඇයි?

ඔබේ මුදල් එකවර වෙනත් ආයෝජන කිහිපයකම යෙදවීමෙන් පහත සඳහන් වාසි ඔබට ලබා ගන්න පුලුවන්.

- විවිධාංගීකරණය: සීමිත සම්පත් තුල තනි කෙනෙක් හෝ සමාගමක් විදිහට මිලදී ගන්නවාට වඩා තනි අරමුදලකට පුලුවන් සුරැකුම්පත් කිහිපයක් ගන්න.
- වෘත්තීයමය කළමනාකරණය: මෙහිදී පළපුරුදු අරමුදල් කළමනාකරුවෙකු විසින් අරමුදල මනාව කළමනාකරණය කරලා එහි ආයෝජනය ඔබ වෙනුවෙන් අඛණ්ඩව අධීක්ෂණය කරනවා
- පහසුව: ඕනෑම වැඩ කරන දිනයක අරමුදල් ඒකක මිලදී ගන්නත් විකුණන්නත් ඔබට පුලුවන්.

## පැ: කොටස් අරමුදල (Equity Fund) සහ මුදල් වෙළඳපොළ අරමුදල (Money Market Fund) අතර වෙනස මොකක්ද?

### මුදල් වෙළඳපොළ අරමුදල (Money Market Fund)

කෙටිකාලීන ලාභ අපේක්ෂා කරන ආයෝජකයින්ට මුදල් වෙළඳපොළ අරමුදල ඉතා සුදුසු නිසා අරමුදල් රඳවා ගැනීමේ කාලය සාමාන්‍යයෙන් මාස 12 ක් වෙනවා. එමඟින් ඉහළ ද්‍රවශීලතාවයක් වගේම ආයෝජකයින්ට ගාස්තු වකින් තොරව ඕනෑම වේලාවක මුදල් යොදන්නත් ආපහු ගන්නත් හැකියාව ලබා දෙනවා. මුදල් වෙළඳපොළ අරමුදල් මූලික වශයෙන් ආයෝජනය කරන්නේ කෙටිකාලීන සුරැකුම්පත් වන රෙපෝස් (repos), භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු, වාණිජ පත්‍රිකා සහ විශ්වාස සහතික වලය.

### කොටස් අරමුදල (Equity Fund)

තාවකාලික වෙළඳපල උච්චාවචනයන් වලට ඔරොත්තු දිය හැකි දිගු කාලීන ආයෝජකයින්ට කොටස් අරමුදලක් සුදුසු වෙනවා. මේ අරමුදල ප්‍රධාන වශයෙන්, කොළඹ කොටස් වෙළඳපොලේ (CSE) ලැයිස්තුගත කොටස්වල ආයෝජනය කරන අතර අරමුදල් ආයෝජකයින්ට දිගුකාලීන ප්‍රාග්ධන ඇගයීම වගේම කොටස් ආයෝජනවල ලාභාංශ තුළින් ප්‍රතිලාභ ලබා දෙනවා.

## පැ: කොටස් අරමුදල (Equity fund) ආයෝජනය කරන්නේ කොතනද?

කොටස් අරමුදල ප්‍රධාන වශයෙන් කොළඹ කොටස් වෙළඳපොලේ (CSE) ලැයිස්තුගත කොටස් යටතේ ආයෝජනය කරනවා.

softlogic INVEST

## පැ: මුදල් වෙළඳපොළ අරමුදල (Money Market fund) ආයෝජනය කරන්නේ කොතැනින්ද?

මුදල් වෙළඳපොළ අරමුදල ප්‍රධාන වශයෙන් කෙටිකාලීන ()ස්ථාවර ආදායම් සුරැකුම්පත් සඳහා ආයෝජනය කරනවා

- රජයේ බැඳුම්කර
- භාණ්ඩාගාර බිල්පත්
- බැංකුකරුවන්ගේ පිළිගැනීම්
- වාණිජ පත්‍රිකා
- සුරක්ෂිත කළ විශ්වාස සහතික
- ස්ථාවර තැන්පතු
- Repos and reverse repos

## පැ: සොෆ්ට්ලොජික් ඉන්වෙස්ට් අරමුදල සඳහා trustee සහ custodian යන පාර්ශවයන් වන්නේ කවුද?

හැටන් නැෂනල් බැංකුව

## පැ: අරමුදලෙන් අය කරනු ලබන ගාස්තු මොනවාද?

| | සොෆ්ට්ලොජික් මුදල් වෙළඳපොළ අරමුදල | සොෆ්ට්ලොජික් කොටස් අරමුදල |
|---|---|---|
| කළමනාකරණ ගාස්තු | 0.45% | 2.25% |
| භාරකාර ගාස්තුව | 0.15% | 0.15% |
| භාරකාර ගාස්තු මසකට | රු.15,000h | රු.15,000 |
| රෙජිස්ට්‍රාර් ගාස්තු මසකට | රු.20,000 | - |
| පිටවීමේ ගාස්තු කිසිවක් | - | පළමු වසර - 3%<br>2වන වසර - 2% සහ<br>3වන වසර 1%<br>මිලදී ගැනීමෙන් වසර තුනකට පස්සෙ පිටවීමේ ගාස්තුවක් අය කරන්නේ නෑ |

## පැ: භාරකාර ගාස්තු යන්නෙන් අදහස් කරන්නේ මොකක්ද?

අදාළ සුරැකුම්පත් සහ දේපල වල ආරක්ෂාව පවත්වාගැනීම සඳහා භාරකාරත්වය (HNB) විසින් අය කරන ගාස්තු භාරකාර ගාස්තු වෙනවා. මේ ගාස්තුව අරමුදලින් අය කර ගන්නවා.

## පැ: අරමුදල් ඒකක තක්සේරු කරන ක්‍රමය මොකක්ද?

සෑම වැඩ කරන දවසකම අරමුදලේ අගය බලන්නේ ඒකකයකට එහි ශුද්ධ වත්කම් වටිනාකම් අගය (NAV) ගණනය කිරීමෙන් (මේක කරන්නේ ඒකෙ තියෙන සේරම කොටස්, ණයකර, විශ්වාස සහතික, නිධි, වෙනත් සුරැකුම්පත් සහ මුදල් වල වර්තමාන වටිනාකම එකතු කිරීමෙන්). අරමුදල පවත්වාගෙන යද්දි සමහර වියදම් අඩු කරාට පස්සෙ (උදා: කළමනාකරණ ගාස්තු, භාරකාර ගාස්තු සහ වෙනත් මෙහෙයුම් වියදම්),ලැබෙන අවසාන අගය අරමුදලේ මුළු ඒකක ගණනෙන් බෙදනවා.

උදාහරණයක් විදිහට, ඔබ දැන් හිතන්න ඔබේ රු: 5,000 ක මුළු ආයෝජනයකට රු: 100 බැගින් ඔබට ඒකක 50ක් ලැබෙනවා කියලා. සති 6 කට පස්සෙ එක ඒකකයක් රු: 110 දක්වා මිල ඉහල ගියොත්,ඔබේ මුළු ආයෝජනයේ වෙළඳපල වටිනාකම රු. 5,000 ඉඳලා රු. 5,500 ක් වෙනවා.

**පැ: සොෆ්ට්ලොජික් ඉන්වෙස්ට් එක්ක ආයෝජනය කරන්න පුලුවන් කාටද?**

- ශ්‍රී ලංකාව තුළ පදිංචිව සිටින ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට.
- ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත හෝ ස්ථාපිත සමාගම්,හෝ ආයතන
- ශ්‍රී ලංකාව තුළ අනුමත අර්ථසාධක අරමුදල් සහ අනුමත දායක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම
- අනේවාසිකයින්: ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන් නොවන පුද්ගලයින්/සීමිත වගකීම් සහිත සමාගම්/ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත ආයතන

**පැ: මම ශ්‍රී ලාංකික පුරවැසියෙක් නොවෙන ආයෝජකයෙක්. මට පුලුවන්ද සොෆ්ට්ලොජික් ඉන්වෙස්ට් එකට රෙජිස්ටර් වෙන්න?**

ඔව්. ශ්‍රී ලංකාවේ ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් එක්ක ගිණුමක් විවෘත කරලා තනි පුද්ගල හෝ ආයතනයක් විදිහට එන ආයෝජකයින්ට ශ්‍රී ලාංකික අරමුදල් වලට මුදල් යොදන්නත් ආපහු  පහසුවෙන්  ගන්නත් පුලුවන්.

**පැ: අරමුදලට ආයෝජනය කරපු මගේ මුදල් මට අහිමි වෙන්න පුලුවන්ද?**

අරමුදලක මුදල් යොදවපු ආයෝජකයෙකුගේ ආයෝජන වටිනාකම තීරණය වන්නේ එදිනට නියමිත ඒකක මිල මත පදනම් වෙලා. අරමුදල ආයෝජනය කරන ඒකක වල මිල උච්චාවචනයට නිරන්තරයෙන් ලක්වෙන්නේ අදාල මුදල් හා දේපල සම්බන්ධ අවදානම් හේතුවෙන් . මෙය ප්‍රධාන වශයෙන් අදාළ වන්නේ Equity Unit Trust Funds සඳහා වන අතර ඒකක මිල ගණන් කොටස්  වෙළඳ පොලේ හුවමාරු වෙන මිලෙහි වෙනස පෙන්වනවා. පැහැර හැරීම වැනි අවදානම් වලට නිරාවරණය වන ස්ථාවර ආදායම් සුරැකුම්පත් සඳහා ආයෝජනය කර ඇති ඒකක භාර අරමුදල් (money market fund) වලට මේක අදාල වෙන්නෙ නෑ.

**පැ: මේ සඳහා framework එක මොකක්ද?**

- සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (SEC)
- භාරකරු / භාරකාර බැංකුව - හැටන් නැෂනල් බැංකුව
- අරමුදල් විගණකවරුන්
- CFA institute code of ethics iy ඊට අදාල ප්‍රමිතීන් මගින් පාලනය වන අරමුදල් කළමනාකරුවන්
- අභ්‍යන්තර compliance and risk කළමනාකරණ කණ්ඩායම